**ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියා මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ (ජීඑෆ්ඒටීඑම්) සෞඛ්‍ය පද්ධති සවිමත් කිරිමේ සංරචකය - 2015**

ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියා මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ (ජීඑෆ්ඒටීඑම්) සෞඛ්‍ය පද්ධති සවිමත් කිරිමේ සංරචකයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ර.) සහ ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියා නිවාරණ ගෝලීය අරමුදල (ජීඑෆ්ඒටීඑම්) අතර 2011 නොවැම්බර් 22 දින එළඹි අංක එස්ආර්එල්-911-ජී15-එස් දරන ප්‍රදාන ගිවිසුමේ සී (8) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මූල්‍යයනය හා ව්‍යාපෘති කාලය

ප්‍රදාන ගිවිසුමට අනුව, වර්තමානයේ සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. යුද්ධයෙන් පසු උතුරු පළාතේ ප්‍රදේශ වල සෞඛ්‍ය ආරක්ෂිත සේවා ඉක්මණින් ප්‍රාතිශ්ඨාපනය කිරීම මඟින් එච්අයිවී/ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියා හි වත්මන් අඩු ව්‍යාප්ති තත්ත්වය පවත්වාගෙන යාම ව්‍යාපෘතියේ අරමුණු වේ. සෞඛ්‍ය පද්ධති සවිමත් කිරිමේ සංරචකය සඳහා ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය එ.ජ.ඩො.15,513,020 ක් වන අතර ජීඑෆ්ඒටීඑම් විසින් මුළු වටිනාකම මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 ජූලි 01 දින ආරම්භ කළ අතර 2016 ජූනි 30 දින වන විට අවසන් කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරික්ෂා කිරීම්ද පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ප්‍රදාන යටතේ කරන ලද ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 4 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 4 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද අනෙකුත් වාර්තා වල ඇතුළත් කරන ලද තොරතුරු සමඟ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති තොරතුරු එකඟ වන බව, සහ

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය,

**3. මූල්‍ය ප්‍රකාශන**

**3.1 මූල්‍ය කාර්ය සාධනය**

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම එ.ජ.ඩො. 2,646,858 කට සමාන රු.359,813,747 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,153,203,374 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, පෙර වර්ෂයේ වියදම හා 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පහත සාරාංශ ගත කෙරේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | | | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|---|
| | 2015 | | 2014 | | |
| | එ.ජ.ඩො. | රු. | එ.ජ.ඩො. | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | - | - | 8,241 | 1,079,921 | 4,471,729 |
| සෞඛ්‍ය පද්ධතිය සවිමත් කිරීම සඳහා ක්‍රියාකාරකම් | 2,646,858 | 359,813,747 | 2,436,089 | 318,055,620 | 1,148,731,645 |
| | **2,646,858** | **359,813,747** | **2,444,330** | **319,135,541** | **1,153,203,374** |

## 3.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සහ පෙර වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තත්ත්වය පහත දැක්වේ.

| | 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | |
|---|---|---|---|---|
| | **එ.ජ.ඩො.** | **රු.** | **එ.ජ.ඩො.** | **රු.** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | | | |
| විදේශ ආධාර වලින් ලද මුදල්- ප්‍රදාන | 2,243,637 | 305,000,000 | 2,428,002 | 317,000,000 |
| දේශීය අරමුදල් වලින් ලද මුදල් | 279,535 | 38,000,000 | 398,284 | 52,000,000 |
| ලංසු ආදායම් වලින් ලද මුදල් | 1,501 | 204,000 | 1,786 | 233,124 |
| වැඩසටහන් වියදම් සඳහා ගෙවූ මුදල් | (2,646,858) | (359,813,747) | (2,426,453) | (316,797,577) |
| **කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / (ඌනතාවය)** | **(122,185)** | **(16,609,747)** | **401,619** | **52,435,547** |
| එකතුකිරීම්/අඩුකිරීම්: ගැලපීම් | | | | |
| අත්තිකාරම් (ශුද්ධ) | 330,631 | 47,630,744 | (363,455) | (47,630,744) |
| විදේශ විනිමය (පාඩු)/ ලාභ | 6,579 | - | (1,502) | - |
| ක්ෂය වීම් | 5,475 | 744,330 | - | - |
| ගෙවිය යුතු ගිණුම් වල වැඩිවීම් | 89,359 | 12,872,913 | 137,533 | 18,031,674 |
| වෙනස | - | - | 63 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල්** | **309,859** | **44,638,240** | **174,258** | **22,836,477** |

| | | | | |
|---|---|---|---|---|
| <u>**ආයෝජන ක්‍රියාකරකම් වලින් ජනිතවූ මුදල් ප්‍රවාහය**</u> | | | | |
| ස්ථාවර වත්කම් | - | - | (8,241) | (1,716,492) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලට භාවිතා කළ ශුද්ධ මුදල්** | **-** | **-** | **(8,241)** | **(1,716,492)** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**</u> | | | | |
| අමාත්‍යංශය වෙත ආපසු යැවු මුදල් | <u>(309,859)</u> | <u>(44,638,240)</u> | <u>(166,017)</u> | <u>(21,756,558)</u> |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලට භාවිතා කළ ශුද්ධ මුදල්** | **(309,859)** | **(44,638,240)** | **(166,017)** | **(21,756,558)** |
| මුදල් ශුද්ධ වැඩි වීම/ (ශුද්ධ අඩු වීම) | නැත | නැත | නැත | නැත |

## 4. විගණන නිරීක්ෂණ

### 4.1 ගිණුම්කරණ අඩු පාඩු

(අ) ව්‍යාපෘති සේවකයින් 631 ක් සඳහා 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 20.88 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් සඳහා සේව්‍යාගේ දායකත්වය ගිණුම් ගත කිරීම වෙනුවට අසම්භාව්‍ය බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත් 13 කට අදාල 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 26.05 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගිණුම කොන්ත්‍රාත්තුවේ අදාල කොටස නිම කිරීමට පෙර වියදම් ගිණුමට හර කර තිබුණි.

### 4.2. නිතී, රීතී, රෙගුලාසි වලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වු අනුකූල නොවු අවස්ථා පහත දැක්වේ.

| නීතිරීති හා රෙගුලාසි යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි | |
| (i) | අංක. 137,138,139 සහ 140 | මුදල් රෙගුලාසි වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට පටහැනිව බලයලත් පාර්ශවයන්ගෙන් සහතික කිරීම් සහ අනුමත කිරීම් නොමැතිව රු.මිලියන 1.57 ක් කොන්ත්‍රාත්කරුවකුට ගෙවා තිබුණි. |
| (ii) | අංක. 756 | රු.මිලියන 4.47 ක් වටිනා ස්ථාවර වත්කම් වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භෞතික සත්‍යාපනය සිදු කර නොතිබුණි. |
| (ආ) | ගෝලීය අරමුදලේ යොමුගත කොන්දේසි අංක 3 (vi) වගන්තිය | එකතුව රු.මිලියන 1.07 ක ගෙවීම් සඳහා වවුචරය සමඟ ගෙවීම් තහවුරු කිරීමේ ලියකියවිලි වල මුල් පිටපත් වෙනුවට ඡායා පිටපත් විගණනයට ඉදිරිපත් කර තිබුණි. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5. 4. 11 ඡේදය | අවස්ථා 273 කදී කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවූ රු. මිලියන 31.45 ක් වූ එකතු කළ අගය මත බදු ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දන්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑඅයි/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | ව්‍යාපෘතිය විසින් මිලදී ගත් පරිගණක හා අදාල මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් වෙනමම පවත්වාගෙන නොතිබුණි. |
| (ඉ) | 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය 4.3.2. ඡේදය | වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දැනටමත් දායකවූ නිලධාරියකු වෙනුවෙන් 2015 ජනවාරි 31 දිනට රු. 164,224 ක් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ප්‍රේෂණය කර තිබුණි. |

## 5. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 5.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත වෙන්කිරීම , වර්ෂය තුළ අරමුදල් ලැබීම්, සමාලෝචිත වර්ෂය තුළදි හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිලිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යනය කිරීම සඳහා එකඟ වු වටිනාකම | | 2015 වර්ෂය සඳහා කළ වෙන්කිරීම | වර්ෂය තුළදී අරමුදල් ලැබීම් | | අරමුදල් උපයෝජනය 2015 වර්ෂය තුළ | | අරමුදල් උපයෝජනය 2015 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ජීඑෆ්ඒටීඑම් | 15.51 | 1,766.58 | 2.19 | 2.24 | 305.00 | 1.93 | 267.11 | 7.58 | 995.50 |
| | **15.51** | **1,766.58** | **2.19** | **2.24** | **305.00** | **1.93** | **267.11** | **7.58** | **995.50** |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මහ භාණ්ඩාගාරය විසින් රු. මිලියන 305 කට සමාන එ.ජ.ඩො. මිලියන 2.24 ක් ව්‍යාපෘතිය වෙත නිකුත් කර තිබුණු අතර එයින් රු. මිලියන 267.11 කට සමාන එ.ජ.ඩො. මිලියන 1.93 ක් එනම් සියයට 87 ක් පමණක් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි. ඊට අමතරව 2011 ජූලි 01 සිට 2016 ජූනි 30 දක්වා කාල පරිච්ඡේදය සඳහා සිදු කළ එ.ජ.ඩො. මිලියන 15.51 ක මුළු ප්‍රතිපාදනයෙන්, එ.ජ.ඩො. මිලියන 7.58 ක් එනම් සියයට 49 ක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 44.64 කට සමාන එ.ජ.ඩො. 309,859 ක් මුදල් අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබුණි. කෙසේ වෙතත් ගෙවිය යුතු මුදල් රු. මිලියන 34.39 ක් 2015 දෙසැම්බර් 31 දිනට හිඟව තිබුණි.

(ආ) 2013 ජූලි සිට 2015 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා ක්‍රියාකාරකම් 24 ක් සඳහා සිදුකළ එකතුව එ.ජ.ඩො. 3,980,419 ක මුළු වෙන්කිරීම අදාල කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි.

**5.2 භෞතික ප්‍රගතිය**

**5.2.1 සෞඛ්‍ය පද්ධතිය සවිබල ගැන්වීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දී හා 2014 දී පලාත්බද සෞඛ්‍ය අධිකාරීන් සඳහා රු.මිලියන 18.52 ක පිරිවැයකට කුඩා පරිමාණ රසායානාගාර 42 ක් ඉදිකිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි. කෙසේ වෙතත් අවශ්‍ය රසායනාගාර උපකරණ සැපයීම් කර නොතිබීම සහ රසායනාගාර තාක්ෂණික ශිල්පීන් ප්‍රමාණවත් පරිදි බඳවා නොගැනීම නිසා 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම රසායනාගාර වල මෙහෙයුම් සිදු නොවුණි.

(ආ) ග්‍රාමීය ප්‍රදේශ වල බාහිර රෝගී අංශ සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණද ගෝලීය අරමුදලේ මාර්ගෝපදේශය අනුව ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීමට පෙර බාහිර රෝගීන්ගේ පැමිණීමේ සාමාන්‍ය හා ගොඩනැගිලි ධාරිතාවය තීරණය කිරීමට පවත්නා යටිතල පහසුකම් විස්තරාත්මකව තක්සේරු කිරීමක් සිදු කර නොතිබුණි. වාර්තා අනුව, එවැනි ඒකක වල දිනකට බාහිර රෝගීන් 200 කට වඩා පහසුකම් පැවතියද අළුතින් ඉදිකරන ලද බාහිර රෝගී අංශ වල දෛනික බාහිර රෝගීන්ගේ පැමිණීම රෝගීන් 100 කට වඩා අඩුව පැවතුණි.

(ඇ) උතුරු පලාතේ මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් වෙත පුහුණුව ලබා දීම සඳහා ව්‍යාපෘතිය පියවර ගෙන තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 7.27 ක් වෙන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් 20 දෙනෙක් පුහුණු කිරීමට අපේක්ෂා කළද, මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් 10 දෙනෙකු පමණක් පුහුණු කර තිබුණු අතර රු. මිලියන 1.29 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් සිදු කළ පැහැදිලි කිරීමට අනුව, සුදුසුකම්ලත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු සීමිත ප්‍රමාණයක් උතුරු පලාතේ සේවයේ යෙදී සිටි අතර එහි ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂිත ඉලක්කයන් සපුරාගත නොහැකි වි ඇත. තවද, ප්‍රජා මූල සෞඛ්‍ය සේවාවන් වල මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන් සඳහා සහ රෝග ආරක්ෂණ කටයුතු සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා දෙමළ භාෂාව කථාකිරීමේ හැකියාව දියුණු කිරීමේ යෝජිත පුහුණු වැඩසටහන් පවත්වා නොතිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් සිදු කළ පැහැදිලි කිරීමට අනුව, සැලසුම් කළ පරිදි ක්‍රියාකාරකම් කිහිපයක් ක්‍රියාත්මක කළ නොහැකි වූ අතර එම ක්‍රියාකාරකම් ව්‍යාපෘතියේ අදියර 2 යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

(ඈ) යුද්ධය පැවති ප්‍රදේශ වල ව්‍යාපෘති මෙහෙයුම් සඳහා නියාමනය හා ඇගයීම් සැලැස්ම සහ උපාය මාර්ගික සැලැස්ම සකස් කොට මෙහෙයවා තිබුණද අදාල සැලසුම් වල සඳහන් ඉලක්ක ලඟාකර ගැනීම තහවුරු කිරීමට ස්වාධීන උපදේශකයෙක් සේවයේ යොදවා නොතිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂක සිදු කළ පැහැදිලි කිරීමට අනුව, 2016 දී පැවැත්වීමට නියමිත සෞඛ්‍ය පහසුකම් ඇගයීමේ සැලැස්ම ව්‍යාපෘති කටයුතු ස්වාධීන

ඇගයීමක් වනු ඇත. තවද, 2013 ජූලි 01 සිට 2016 ජූනි 30 දක්වා කාල පරිච්ඡේදය සඳහා සකස් කළ ප්‍රසම්පාදන හා සැපයුම් කළමනාකරණ සැලැස්ම ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඵලදායී ලෙස නියාමනය සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කාල රාමුව පැහැදිලි කිරීමේ ප්‍රසම්පාදන වැඩසටහන සමඟ නොගැලපුණි.

### 5.2.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු පලාතේ සිදු කරගෙන යනු ලැබූ ඉදිකිරීම් සඳහා අධීක්ෂණ උපදේශකයින් ලෙස රාජ්‍ය අංශයේ සංවිධාන 02 ක් ව්‍යාපෘතිය සේවයේ යොදවා තිබුණි. උපදේශන ගිවිසුමේ 36 වන වගන්තිය ප්‍රකාරව තත්ත්ව පාලන ලේඛනයක් උපදේශකයන් විසින් පවත්වා නොතිබුණු බව ක්ෂේත්‍ර පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. එහි ප්‍රතිපලයක් ලෙස සිදුකළ වැඩ හා අමු ද්‍රව්‍ය භාවිතය පිලිබඳ තත්ත්ව පාලනයන් කළ බව තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි කිසිවක් නොවීය. තවද, එකඟ වූ පරිදි උපදේශකයින් විසින් වැඩ බිම් වලට තාක්ෂණික නිලධාරීන් සේවයේ යොදවා නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) මුසාලි හි කාර්යාල නිවාස වල නවීකරණ වැඩ 2015 ජූනි 30 වන විට අවසන් කර තිබුණද බාර ගැනීමේ සහතිකය හා වැඩ අවසන් කිරීමේ සහතිකය 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිකුත් කර නොතිබුණි.

(ඇ) 2014 අගෝස්තු 09 ට පෙර අවසන් කිරීමට අපේක්ෂිත වූ යාපනයේ සන්දිලිපායි හි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ගොඩනැගිල්ලේ නවීකරණය සඳහා කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඈ) ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ 2015 ඔක්තෝබර් 19 දිනැති අංක ජීඑෆ්ඒටීඑම්/එච්එස්එස්/ආර්09/කොන්ත්‍රාත්/2015/01 ලිපියට අනුව, අරමුදල් ලැබීමේ ප්‍රමාදය හා අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් නවීකරණ වැඩ සඳහා කොන්ත්‍රාත්තු 12 හී සෑම කොන්ත්‍රාත්තුවක් සඳහා දින 180 ක කාල දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය තුළ පැවති අයහපත් කාලගුණ තත්ත්වය තහවුරු කිරීමට කාලගුණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද කාලගුණ වාර්තා වැනි සාක්ෂි කිසිවක් ඉදිරිපත් නොවීය. එම කාලය තුළදී යාපනයේ ඊට අනුබද්ධ ස්ථාන වල සිදු කළ අනෙකුත් ඉදිකිරීම් සඳහා දින 08 සිට 10 දක්වා පමණක් දීර්ඝ කිරීම් ලබා දී තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.